# කොවිඩ් 19 සති පාසල සබරගමු පළාත.

## නිවිතිගල අධ්‍යාපන කලාපය.

## 9 - ශ්‍රේණිය - - ඉතිහාසය -2021-පළමු වාරය

| | | |
|---|---|---|
| පැවැරුම | :- | 07 වන සතිය (2021.02.14 සිට 2021.02.20 දක්වා) |
| ඒකකය 01 | :- | **ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසි යටතට පත්වීම.** |
| ක්‍රියාකාරකම | :- | **ලන්දේසි අධිකරණ කටයුතු පිළිබඳ සොයා බලමු.** |
| හැඳින්වීම | :- | ලන්දේසි පාලන සංවිධානයේ පැවැති තවත් අංශයක් ලෙස අධිකරණ අංශය දැක්විය හැක.<br>ලංකාවේ වර්තමානයේ ක්‍රියාත්මක වන නීති සංග්‍රයේ කොටසක් වන රෝම ලන්දේසි නීතිය ලන්දේසින්ගෙන් ලද දායාදයකි. ලන්දේසීන් විසින් ලංකාවේ පැවති දේශිය නීති හා සිරිත්විරිත් වලට ගැළපෙන ලෙස රෝම ලන්දේසි නීතිය සංස්කරණය කොට ලංකාවේ ක්‍රියාත්මක කරන ලදී. ලන්දේසිහු මෙහි පැවැති නෛතික ආයතන ප්‍රයෝජනයට ගත් අතර නව උසාවි පද්දතියක් ද මෙරටට හඳුන්වා දෙන ලදී. |
| සිසු උපදෙස් | :- | *පියවර 01* 9 ශ්‍රේණිය ඉතිහාසය පෙළපොතේ පිටු අංක 14 සිට 15 දක්වා හොඳින් කියවා ගන්න.<br>*පියවර 02* පසුගිය සතියේ ක්‍රියාකාරකම අවසන් වූ තැනින් ඉහතින් දී ඇති හැඳින්වීම සටහන් කරගන්න.<br>*පියවර 03* පෙළ පොත උපයෝගී කරගනිමින් පහත ක්‍රියාකාරකම් නිරතවන්න. |

***<u>ක්‍රියාකාරකම 06</u>***

පහත ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.

01. ලන්දේසි අධිකරණ පද්දතියේ ඉහළින්ම පිහිටි අධිකරණය දක්වන්න.
02. එම අධිකරණයේ ප්‍රධානියා නම් කරන්න.
03. ලන්දේසි අධිකරණ පද්දතියේ ඉහළම අධිකරණය මගින් විසඳූ නඩු මොනවා ද?
04. සිවිල් රාද් හෙවත් සිවිල් උසාවි පිහිටා තිබූ ප්‍රදේශ මොනවාද ?
05. සිවිල් උසාවි මගින් විසදන ලද නඩු වර්ග නම් කරන්න.
06. ලැන් රාද් ලෙස හැඳින් වූ උසාවි වර්ගය කුමක් ද?
07. ලැන් රාද් පිහිටා තිබූ ප්‍රදේශ නම් කරන්න.
08. ලැන් රාද් උසාවි තුළ ප්‍රධානියා ලෙස කටයුතු කළේ කවුරුන් ද?
09. මෙම උසාවි තුළ පැවැති විශේෂතාවය කුමක් ද?
10. ලන්දේසි අධිකරණ පද්දතියේ පහළින්ම පිහිටි අධිකරණය නම් කරන්න.
11. මෙම උසාවි තුළ කටයුතු කළ දේශිය නිළධාරීන් නම් කරන්න.
12. ලන්දේසි උසාවි පද්දතිය අනුපිළිවෙළින් ලියා දක්වන්න.

සැකසුම :- උදාර අරවින්ද
නිවිතිගල කලාප කාර්යාලය
ර/කලවාන ජාතික පාසල